**මානව අයිතිවාසිකම් අධ්‍යයන කේන්ද්‍රය**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

# <u>අයදුම්පත්‍ර කැඳවීම</u>

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මානව අයිතිවාසිකම් අධ්‍යයන කේන්ද්‍රය මගින් 2020 වර්ෂයට අදාළව පහත සඳහන් සති අන්ත පාඨමාලා සඳහා සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. මානව අයිතිවාසිකම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

**අපේක්ෂිත සුදුසුකම් -:**

- මෙම අධ්‍යයන කේන්ද්‍රයේ පාලක මණ්ඩලය මගින් පිළිගනු ලබන මානව අයිතිවාසිකම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සමත්ව තිබීම

**<u>හෝ</u>**

- පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධි පාඨමාලාවකට අදාළව මානව අයිතිවාසිකම් විෂය ඒකකයක් හදාරා තිබීම

**<u>හෝ</u>**

- එක් වතාවකදී අ.පො.ස (උසස් පෙළ) විෂයන් 3කින් සමත්ව සිටීම සහ මානව අයිතිවාසිකම් හෝ ප්‍රජා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම හෝ සහභාගිවීම පිළිබඳව සනාථ කළහැකි පළපුරුද්දක් ලබා තිබීම

**<u>හෝ</u>**

- එක් වතාවකදී අ.පො.ස. (උසස් පෙළ) විෂයන් 3ක් සමත්ව සිටීම සහ තමන් සේවය කරන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනය තුළ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම්වල නියුක්තවීම හෝ එසේ නියුක්තවීමේ හැකියාව ලිඛිතව සනාථ කිරීමට හැකිවීම.

**පාඨමාලා කාලය-:** මාස දොළහකි    **මාධ්‍යය -:** සිංහල සහ දෙමළ
**ආරම්භය-:** 2020 ඔක්තොම්බර් මස    **පාඨමාලා ගාස්තුව-:** රු. 25,000.00

## 2. මානව අයිතිවාසිකම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

**අපේක්ෂිත සුදුසුකම් -:**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හෝ වෙනත් විශ්වවිද්‍යාලයක ලියාපදිංචි අභ්‍යන්තර උපාධි අපේක්ෂකයකු වීම

**<u>හෝ</u>**

- එක් වතාවකදී අ.පො.ස (උසස් පෙළ) විෂයන් 3ක් සමත්වීම සහ මානව අයිතිවාසිකම් හෝ ප්‍රජා සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක රාජ්‍ය නොවන ආයතනයක ක්‍රියාකාරිකයෙකු වීම

**<u>හෝ</u>**

- එක් වතාවකදී අ.පො.ස. (උසස් පෙළ) විෂයන් 3ක් සමත්වීම සහ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක වසර 02ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**<u>හෝ</u>**

- එක් වතාවකදී අ.පො.ස (සාමාන්‍ය පෙළ) විෂයන් 6ක් සමත්වීම සහ රාජ්‍ය නොවන ආයතනයක වසර 05ක සේවා පළපුරුද්දක් ඇති දැනට එම අංශයේ සේවයේ නිරතව සිටින අයෙකු වීම.

**පාඨමාලා කාලය-:** මාස දෙකකි    **ආරම්භය-:** 2020 ඔක්තොම්බර් මස
**මාධ්‍යය-:** සිංහල සහ දෙමළ    **පාඨමාලා ගාස්තුව-:** රු 12,000.00

**සැළකිය යුතුය:**

අයදුම්පත්‍ර http://arts.pdn.ac.lk/main/downloads/general.php හෝ www.cshrperadeniya.edu.lk යන වෙබ් අඩවි මගින් බාගත කර ගැනීමට හෝ අධ්‍යයන කේන්ද්‍රයෙන් ලබා ගැනීමට හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **<u>2020.09.25</u>** වෙනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.


**අධ්‍යක්ෂක,**
**මානව අයිතිවාසිකම් අධ්‍යයන කේන්ද්‍රය,**
**SPB 2, ශාස්ත්‍ර පීඨය,**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය,**
**පේරාදෙණිය.**
වැඩිදුර විස්තර සඳහා අමතන්න දු.අංක - **0812386481**